# කලන්දක ජාතකය

ජාතක කථාව - යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි අප බෝසතාණන් වහන්සේ අපරාපයර්‍ය වේද්‍ය අකුසල කර්මයකින් ලෙහෙනව උපන් සේක. එසමයෙහි එක වන ලැහැබෙක කැදැල්ලක් බැඳ පැටියන් රක්‍ෂා කොට එතැන්හිවසන කල්හි දිනක් මහා මේඝයක් ඇතිව දස දිසා අඳුර කරවමින් මහත් මේඝ ගර්ජනා පවත්වමින් ධාරානිපාත වැසි වසින්නට පටන් ගත. මෙසේ ක්‍රමයෙන් වැස ඇළ දොළ ගංගා දිය පිරී ඉතිරී මහ වතුරෙන් රුක් මුලිනුපුටා හෙළමින් තැන තැන ගල් මුල්හි පැහැර උදුරමින් කුදු මහත් සතුනට ව්‍යසන කරමින් මහ වනය එක හෙළා වෙවුල්වා භයානක ශබ්ද පවත්වමින් රළ රැළි දිවන්නට වන.

එසේ දිවගත් මහ වතුර කලන්දක බෝධිසත්වයන්ගේ දරු පැටියන් හා සමග කැදැල්ල උපුල්වා ගෙන ගොස් මුහුදට හෙලාලීය.

එකල්හි ලෙහෙනව උපන් අප බෝසතාණෝ මුහුද වැටුනාවූ තම දරු පැටියන් ගොඩලා ගනිමියි යන උසස් අදහසින් ආ අධික වීර්‍යයෙන් "මුහුද ඉසිමි"යි පටන් ගෙන වලිගය මුහුදෙහි ඔබ ඔබා දිය ගෙන ගොඩ ඉස ඉස මහ මුහුද දිය ඉස නිමවමියි සිතූ සේක. මෙසේ දරු පැටියන් ගොඩ ගනිමියි යන විර්යය අදහසින් උත්සාහ කරන්නට පටන් ගෙන සත් දිනක් ඉක්මුණු කල්හි අප බෝසතාණන්ගේ උදාරතර වීර්‍යධ්‍යාශයේ මහත්වයෙන් සක් දෙවිඳුගේ පාණ්ඩකම්බල ශෛලාසනය හුණුවිය.

එකල්හි සක් දෙවිඳු මිනිස් ලොව බලනුයේ පුරණ ලද බෝධි සම්භාර ඇති මහ බෝසතාණන්ගේ මේ උදාරතර අදහස දැක මිනිස් ලොවට අවුත් මහා මුහුද ඉස්නා බෝසතුන්ට අභිමුඛව සිට "එම්බා! ලෙහෙනාණෙනි, දිය ඉස ඉස ඉඳිනේ කවර කාරණයක් පිණිසද? ඒ කාරණය මට නොවළහා ඉඳුරාම කියවයි කීහ.

අප බෝසතාණෝ එවිට කියන්නාහු මහ වතුරෙන් ගිලිහුනාවූ කැදැල්ල හා මාගේ දරු පැටියන් ගොස් මේ මහ මුහුද හෙළනා ලද්දාහුය. එසේ හෙයින් මේ මුහුද දියත් මාගේ වලිගය තෙමා ගොඩ ඉස මුහුද වියලා දරු පැටියන් ඇර ගන්නා පිණිස උත්සාහ කරමියි කීහ.

එබස් අසා ශක්‍ර දේවේන්ද්‍රයා කියනුයේ එම්බා ලෙහෙනාණෙනි! නුඹ තිරිසන් යෝනියෙහි උපන්න හෙයින

නුවණ මදව නොදන්නමුත් මේ මහා සමුද්‍රය නම් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පනස් යොත්නක් වට ඇත්තේය. සුවාසූ දහසක් යොදුන් ගැඹුර ඇත්තේය. මෙසේවූ මහ මුහුද වලිගය තෙම තෙමා ගොඩ ඉස ඉස දිය නිම වන්නේ කවර කලෙකින්ද? එසේ හෙයින් තිරිසන් යෝනියෙහි උපන් ක්‍ෂුද්‍ර ප්‍රාණීවූ නුඹවැන්නවුන් තබා බලසම්පන්නවූ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදිවූ යම්කිසි ආනුභාව සම්පන්න මහා පුරුෂයෝ සියෙක් දහසෙක් කෙළෙක් වී නමුත් ඍධි ආදිවූ ආනුභාවයක් නැතිව තමාගේ ශක්තියෙන් මේ මහ මුහුද දියකඳ ඉස නිමවා ගත නොහෙතියි කීහ.

එවිට අප බෝසතාණෝ එබසට ඔහුට කියන්නාහු එම්බල පුරුෂයාණෙනි නුඹසේම කිහිපදෙනෙකුන් ලදහොත් මහ මුහුද ඉස්නා තබා කවර නම් කාරියක් සිද්ධකොට ගත නොහැක්කේද? නුඹ කරන කතාවෙන්ම සිත ඇති වීර්යයවත්කම ප්‍රකාශ විය. එසේ හෙයින් නුඹ වැනි නිරුත්සාහ කුසීතයන් හා සමග කතාකොට දැන් කාලය විනාශ කිරීම අප වැන්නවුන්ට සුදුස්සෙක් නොවෙයි. එහෙයින් මෙතැන මද විගසකුත් නොසිට වහා නික්ම යවයි කීහ.

එවිට ශක්‍රදේවේන්‍ද්‍රතෙම සිතනුයේ මෙබඳු අසදෘශ වූ වීර්‍යවත් මහා පුරුෂයන් විසින් සිතූ කාරිය සිද්ධ කොට දුනමැනවයි සිතා තමාගේ ශක්‍රාත්ම භාවයෙන් පෙනී සිට බෝධිසත්වයන්ගේ දරු පැටියන් ගොඩ ලා දෙමින් අභිමතාර්‍ථය සිද්ධ කෙළේය.

එසමයෙහි කලන්දකව උපන්නේ අප බුදුරජාණන් වහන්සේය.